# උත්ථාන සමයේ දෙවන සතිය
## සඳුදා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොතෙන් ගත් පාඨයෙකි. ක්‍රියා 4 : 23–31

**සියල්ලෝ ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණව දේව වාක්‍යය නිර්භීත ලෙස ප්‍රකාශ කළෝය.**

පේදුරු හා ජුවාම් නිදහස් කරනු ලැබූ පසු සිය මිතුරන් වෙත ගොස් නායක පූජකයන් ද ප්‍රජා මූලිකයන් ද තමන්ට කී දේ සැළ කළහ. මෙය ඇසූ ඔව්හු එක හඬින් දෙවියන් වහන්සේට මෙසේ යාච්ඤා කළහ. “මහෝත්තම ස්වාමිනි, අහසත්, පොළොවත්, මුහුදත් එහි ඇති සියල්ලත් මැව්වේ ඔබ වහන්සේ ය. ශුද්ධාත්මයාණන් කරණකොටගෙන ඔබගේ දාසයා වූ ද අපගේ පියා වූ ද දාවිත් රජුගේ මුඛයෙන් කතා කරමින්
“විජාතීන් කෝප වූයේ කුමට ද?
ජනයන් නිශ්ඵල උපා යෙදුවේ කුමට ද?
ස්වාමින් වහන්සේට ද සිය මෙසියස්වරයාණන්ට ද විරුද්ධව පොළොවේ රජවරු සැරසී සිටියා හ. අධිපතියෝ ද එක්රැස් වූ හ”යි
ඔබ වහන්සේ වදාළ සේක. සැබැවින් ම ඔබ ආලේප කළ ඔබගේ සුවිශුද්ධ සේවකයාණන් වූ ජේසුස් වහන්සේට විරුද්ධව හෙරෝද් හා පොන්තියුස් පිලාත් විජාතීන් ද ඉශ්රායෙල් ජනයා ද සමඟ මේ නුවර රැස් වූහ. එසේ කළේ ඔබගේ බලයෙන් හා කැමැත්තෙන් සිදු වන්නට ඔබ පෙර නියම කළ සියල්ල ඉටුවන පිණිස ය. දැන් ඉතින් ස්වාමිනි, ඔවුන්ගේ තර්ජන සලකා බලා ඔබගේ වචනය නිර්භීත ව ප්‍රකාශ කිරීමට ඔබගේ දාසයන්ට වර දුන මැනව. සුව කිරීමට ඔබගේ හස්තය දිගු කළ මැනව. තවද ඔබගේ සුවිශුද්ධ සේවකයාණන් වූ ජේසුස් වහන්සේගේ නාමානුභාවයෙන් ලකුණු ද අරුම පුදුම දේ ද සිදු කළ මැනව. “මෙසේ යාච්ඤා කළ පසු ඔවුන් රැස් ව සිටි ස්ථානය කම්පා විය. ඔව්හු සියල්ලෝම ශුද්ධාත්මයාණන් ගෙන් පිරී දෙවියන් වහන්සේගේ වචනය නිර්භීත ලෙස ප්‍රකාශ කළහ.

දේව වාක්‍යය එසේය.

# පිළිතුරු ගීය

ගීතාවලිය 2 : 1 – 9

පිළිතුර: සමිඳුන් සරණ සොයා යන සියල්ලෝ ආසිරි ලබන්නෝ ය. ආලේලූයා //

ගීය:

ජාතීන් විප්ලවයට සැරසෙනුයේ මන්ද? ජනකායන් නිස්සාර කුමන්ත්‍රණ කරනුයේ මන්ද? සමිඳාණන්ට ද එතුමන්ගෙන් අබිසෙස් ලත් නිරිඳාණන්ට ද මහීපාලයෝ විරෝධීව නැගිට සිටින්නෝය. අධිපතිවරු එක් රැස් වී උපා යොදන්නෝය.

අප හිර කර ඇති විලංගු බිඳ දමමින්, යදම් කඩා දමමින් 'අපි නිදහස ලබමු'යි ඔව්හු පවසන්නෝය. සගලොව සිහසුන් අරා වැඩ සිටින උත්තමයාණෝ සිනාසෙන සේක. සමිඳාණෝ ඔවුන් හට පරිහාස කරන සේක.

එකල උන් වහන්සේ කෝපයෙන් ඔවුන්ට තරවටු කරන සේක. උදහසින් ඔවුන්ට තර්ජනය කරන සේක.
මාගේ ශුද්ධ සියොන් ගිර මත්තෙහි මා රජිඳු හට කිරුළු පළඳවා රජකම දුන්නෙමි.

මම දේව නියෝගය ප්‍රකාශ කරන්නෙමි. එතුමාණෝ මට කතා කොට 'නුඹ මාගේ පුත් කුමරු ය. අද මම ඔබේ පිය රජ වූයෙමි. නුඹ කැමති දෙයක් මාගෙන් අයදින්න. සකල ජාතීහු නුඹ උරුමය වන්නෝය. මුළු මහ පොළොව ද නුඹ සන්තක වන්නේය. නුඹ දරදඬු පාලනයකින් ඔවුන් සිඳ බිඳ මැටි බඳුනක් සේ සුණු විසුණු කර ඇතැ'යි වදාරණ සේක.

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
ක්‍රිස්තුස් වහන්සේ වද විඳිය යුතු බවත්
තුන්වනදා මළවුන්ගෙන් නැගිට්ය යුතු බවත් ශුද්ධ ලියවිල්ලෙහි ලියා ඇත.
ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් **3** : 1 – 8

**ජලයෙන් හා ආත්මයාණන්ගෙන් නූපන්නොත් ඔහුට දෙවියන් වහන්සේගේ රාජ්‍යයට පිවිසිය නොහැක.**

පරිසිවරුන්ගෙන් කෙනෙකු වූ ද, ජුදෙව්වරුන්ගේ ප්‍රධානයකු වූ ද නිකදේමුස් නම් මිනිසෙක් විය. ඔහු එක් රැයෙක උන් වහන්සේ වෙත අවුත් 'ගුරු දේවයිනි, ඔබ දෙවියන් වහන්සේ වෙතින් වැඩම කළ ගුරුවරයෙකැ යි අපි දනිමු. මන්ද දෙවියන් වහන්සේ තමා සමඟ වැඩ නොසිටින සේක් නම් කිසිවකුට ඔබ කරන මේ හාස්කම් කළ නොහැකිය''යි කීය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින් "ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. යමෙකු නැවත නූපන්නොත් ඔහුට දෙවියන් වහන්සේගේ රාජ්‍යය දැකගත නොහැකි ය''යි ඔහුට වදාළ සේක. නිකදේමුස් කතා කරමින් "මනුෂ්‍යයෙකු මහලුව සිටියදී උපදින්නට පුළුවන් කොහොමද? දෙවන වරටත් මවු කුසට පිවිස උපත ලැබිය හැකිදැ''යි ඇසීය.

ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින් "ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. යමෙකු වතුරෙන් ද ආත්මයාණන්ගෙන් ද නූපන්නොත් ඔහුට ස්වර්ග රාජ්‍යයට පිවිසිය නොහැකි ය. ශරීරයෙන් උපදින දේ ශාරීරික ය. ආත්මයාණන්ගෙන් උපදින දේ ආත්මික ය. ඔබ නැවත උපදින්නට ඕනෑ ය යි මා කීවාට පුදුම නොවන්න. සුළඟ සිතූ සිතූ තැන්වල

හමයි. එහි ශබ්දය ඔබට ඇසෙයි. එහෙත් එය කොතැනින් එන්නේ ද කොතැනට යන්නේ දැයි ඔබ නොදන්නාහු ය. ආත්මයාණන්ගෙන් ජනිත වූ හැම කෙනෙකුන් ද එසේම ය''යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.